ධර්මදූත විද්‍යාලය - බදුල්ල

ප්‍රථම වාර පරීක්ෂණය - 2017

# ගණිතය

7 ශ්‍රේණිය කාලය -: පැය 02යි.

## 1 කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(1) ද්විපාර්ශ්වික සමමිතිය ලැබෙන සේ රූපයේ ඉතිරි කොටස සම්පූර්ණ කරන්න.



(2) A= { “ කිතල්ඇල්ල ” යන වචනයේ අකුරු } යන කුලකය ,අවයව සහල වරහන් තුළ ලිවීමෙන් කුලකය ලියා දක්වන්න.

(3) අගය සොයන්න.12 ÷ 6 + 2

(4) 3 ☐ 4 යන සංඛ්‍යාව 4න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාවක් වීම සඳහා හිස්තැනට සුදුසු ඉලක්කම් සියල්ල ලියන්න.

(5) සමාන්තර රේඛා යුගලය නම් කරන්න.



(6) 8 හී ගුණාකාර 4ක් ලියන්න.

(7) දර්ශක අංකනය භාවිතයෙන් ලියන්න.

$2 \times 2 \times œ \times œ \times œ \times b$

(8) ඔබ ඉපදුන වර්ෂය අයත් වන්නේ කී වැනි සහස්‍රයකට ද ?

(9) $3^3$ විහිදුවා අගය සොයන්න.

(10) අධික අවුරුදු තෝරන්න.

ක්‍රි.ව. 1816 ,ක්‍රි.ව. 1953 , ක්‍රි.ව. 1800 ,ක්‍රි.ව.2017 , ක්‍රි.ව. 1200 ,ක්‍රි.ව. 2008

(11) $(12+8) \div (6 - 2)$ සුළු කරන්න.

(12) 72හි සාධක සොයන්න.

(13) $X = 2$ වන විට , $3x^3$ හි අගය සොයන්න.

(14) දින 172 යන්න මාස හා දින වලින් දක්වන්න.

(15) ක්‍රි.ව.1978 කී වන සියවසට අයත් වේද?

(16) 


B කුලකය අයත් අවයව සියල්ල නිශ්චිතව හඳුනාගත හැකි පොදු ලක්ෂණය සඟල වරහන් තුළ ලිවීමෙන් කුලකය ලියා දක්වන්න.

(17) 567සංඛයාවේ ඉලක්කම් දර්ශකය සොයන්න.

(18) 78 ☐ යන සංඛ්‍යාව 3න් බෙදේ . හිස් කොටුවට ගැළපෙන ඉලක්කම් 02ක් ලියන්න.

(19) 24 හා 36 හි මහා පොදු සාධකය සොයන්න.

(20) රූපයේ දක්වා ඇති කෝණය නම් කරන්න.



## 11 කොටස

- **ප්‍රශන සියල්ලටම පිළිතුරු සපයන්න.**

**(01 )**

a. ( 8 + 6 ) ÷ 7 + 3

1. ගණිත කර්ම යෙදී ඇති අනුපිළිවෙල ලියා දක්වන්න.

11. ඒ අනුව ඉහත ප්‍රකාශනයේ අගය සොයන්න.

b. සමමිතික අක්ෂ දෙකක් පමණක් ඇති ද්වීපාර්ශ්වික සමමිතික රූපයක් අඳින්න.

c. 1. $3^4$ හි පාදය හා දර්ශකය ලියන්න.

11. $3^4$ විහිදුවා ලියා අගය සොයන්න.

111. $3^4$ හි පාදය හා දර්ශකය මාරු කළ විට ලැබෙන බලයේ අගය සොයන්න.

(02)

a) 24 , 36 , 48 සංඛ්‍යා වල

1. ප්‍රථමක සංඛ්‍යාවල ගුණිත ලෙස දක්වන්න.

11. 24 , 36 , 48 හි සංඛ්‍යා හි ම.පො.ස. සොයන්න.

111. 24 , 36 , 48 සංඛ්‍යා වල කු.පො.ගු. සොයන්න.

b) බස් නැවතුම්පළකින් A නගරයට සහ B නගරයට පිළිවලින් මිනිත්තු 12කට සහ මිනිත්තු 15කට වරක් බස් රථ පිටවේ. උදෑසන 8.00ට A නගරයට සහ B නගරයට බස් රථ එකවර පිටත් වූයේ නම් , නැවත නගර දෙකට එකවර බස් රථ පිටත් වන්නේ කවර වේලාවකදී ද?

(03)

a. A ={ 1ත් 20ත් අතර ඇති 3හි ගුණාකාර }

1. ඉහත කුලකය අවයව මගින් ලියා දක්වන්න.

11.ඉහත කුලකය වෙන් රූපයකින් දක්වන්න.

b. 1. එකතු කරන්න.

| අවුරුදු | මාස | දින |
|---|---|---|
| 08 | 11 | 21 |
| 05 | 04 | 19 |
| | | |

11.තුෂාර 2011 .03.15 දින සිට 2016.08.07 වන දින දක්වා ක්‍රීඩා පුහුණු වීම් සඳහා විදේශගත වී සිටියේය. ඔහු විදේශගතව සිටි මුළු කාලය සොයන්න.?

c. 20 සියවසේ ආරම්භක දිනය හා අවසාන දිනය ලියා දක්වන්න.

(04)

a 1. සරල රේඛා ඛණ්ඩයක් අඳින්න. එය AB ලෙස නම් කරන්න.

11. AB රේඛා ඛාණ්ඩයට ඉහළින් අති ලම්භ දුර 3.5cm ක් වන X නම් ලක්ෂයක් ලකුණු කරන්න.

111. X හරහා AB රේඛාවට සමාන්තරව PQ සරල රේඛාව අඳින්න.

b සංඛ්‍යා රේඛාව භාවිතයෙන් එකතු කරන්න. ( - 4 ) + ( +3 )

c සංඛ්‍යා රේඛා භාවිතයෙන් තොරව එකතු කරන්න.

1. ( +3 ) + ( -7 ) 11. ( -6 ) + ( -5 ) 111. ( -4 ) + ( +8 )

( 05 )

a 108= $A^X$ x $B^Y$ ,A හා B ප්‍රථමක සංඛ්‍යා වේ.

1. A , B , X හා Y හි අගය සොයන්න.

b 1. $2x^2y$ විහිදුවා ලියන්න.

11. x = 2 හා y = 4 නම් ඉහත ප්‍රකාශනයේ අගය සොයන්න.

c 1. පහත දැක්වෙන කෝණය මැන අගය ලියන්න.




11. පහත දී ඇති කෝණය ,කෝණමානය භාවිතයෙන් ඇඳ දක්වන්න.

$120^0$

MATHS PAPERS.INFO



ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න